පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 06 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **කතෝලික ධර්මය**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : **පැය 02 යි.**

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. කිතුනු අපගේ ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,
(1) ශුද්ධ වූ පවුල යි. (2) ශුද්ධ බයිබලය යි. (3) දේව ප්‍රේමය යි. (4) නව ගිවිසුම යි.

02. දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා එය ඉතා .......... බව දුටු සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
(1) අලංකාර (2) සුන්දර (3) විශේෂ (4) මනහර

03. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතෙහි බාහිර සලකුණ වන්නේ,
(1) පූප සහ මිදියුෂ ය. (2) කුරුසිය ය. (3) පාස්කු ඉටිපහන ය. (4) පඬුරු පෙරහැර ය.

04. දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍ය පවත්වනු ලබන්නේ,
(1) ජනවාරි 01 ය. (2) අගෝස්තු 15 ය. (3) දෙසැම්බර් 08 ය. (4) සැප්තැම්බර් 08 ය.

05. අප යාච්ඤා කරන කල අන් අය හෙළා නොදැකිය යුතු බව අපට පෙන්වා දෙන උපමාව වන්නේ,
(1) පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව ය. (2) මැදියම් රැයේ පැමිණි මිත්‍රයා පිළිබඳ උපමාව ය.
(3) අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව ය. (4) වපුරන්නා පිළිබඳ උපමාව ය.

- **පහත සඳහන් වාක්‍ය හරි නම් ✓ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06. එළිදරව්ව පැරණි ගිවිසුමට අයත් පොතකි. ( )

07. දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ හතරකි. ( )

08. කාම මිත්‍යාචාරය නොකරව යනු පස්වන දේව පනත යි. ( )

09. විශ්වාස ලක්ෂණයේ අඩංගු සත්‍යතා දොළහකි. ( )

10. යෙසායා දිවැසිවරයා ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ අනාවැකි ප්‍රකාශ කළ අයෙකි. ( )

- **ගැළපෙන පරිදි යා කරන්න.**

| | 'අ' | 'ආ' |
| --- | --- | --- |
| 11. | මාක් ශුභාරංචියේ සංකේතය | සුදු වස්ත්‍රය |
| 12. | උතුම් ම දේව මෑවිල්ල | දෙවන ජුවාම් පාවුලු මුනිතුමා |
| 13. | ක්‍රිස්තුන් වහන්සේ පැළඳ ගැනීමේ සංකේතය | සිංහයා |
| 14. | සැම විටම සත්‍ය කතා කිරීම | මිනිසා |
| 15. | තමා මරන්නට ආ පුද්ගලයාට සමාව දුන්නේ | අටවන පනත |

- **නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

( මාංශගතවීම/ ජාකොබ් / නෙබුකද්නෙශර් රජු/ දාසිය/ ශරීරය )

16. සුවිශේෂක ජොහාන් තුමා ...................................................................... තුමාගේ සහෝදරයෙකි.

17. ''බලන්න, මම ස්වාමීන් වහන්සේගේ ...................................................................... වෙමි.''

18. ''ඔබ උදෙසා දෙනු ලබන මාගේ ...................................................................... මේ ය.''

19. තුන්කාලයේ ආරාධනාව තුළින් ජේසුස් වහන්සේගේ ...................................................................... සිහිගන්වයි.

20. 'දූරා' නම් ස්ථානයේ රන් රූපයට වන්දනා කිරීමට ...................................................................... නියෝග කරන ලදි.

(ලකුණු 2X20=40)

## II කොටස

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) 'පංච පුස්තකය' යන්නට හේබ්‍රෙව් වචනය ලියන්න. (ලකුණු 02)
    (ii) නව ගිවිසුමේ ශුභාරංචි **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
    (iii) ශුද්ධ බයිබලය ඔබේ ජීවිතයේ යාච්ඤාවට යොදා ගන්නා අවස්ථා **තුනක්** ලියන්න. (ලකුණු 06)

02. (i) රෝම අධිරාජ්‍යයේ සියලු වැසියන්ගේ සංගණනයක් ගැනීමට නියෝග කළේ කවුද? (ලකුණු 02)
    (ii) ලූක් ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 04)
    (iii) ජේසුස් වහන්සේ ව අනුගමනය කරන දරුවෙකු ලෙස ඔබ තුළ ගොඩනගා ගත යුතු ගුණාංග **තුනක්** ලියන්න. (ලකුණු 06)

03. (i) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළේ කවදා ද? (ලකුණු 02)
    (ii) රදගුරුතුමා මගින් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධාන **දෙක** නම් කරන්න. (ලකුණු 04)
    (iii) කිතුනු දරුවෙකු ලෙස ඔබේ මීසමේ පියතුමාට සහය විය හැකි ආකාර **තුනක්** ලියන්න. (ලකුණු 06)

04. (i) දසපනතේ පළමු පනත ලියන්න. (ලකුණු 02)
    (ii) ශුද්ධ වූ සභාව විසින් ගොඩමස් වැළකීමට නියම කර ඇති දිනයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
    (iii) ඉරුදින දිව්‍ය පූජාව අර්ථවත් කර ගැනීමට ඔබ කරන ක්‍රියාකාරකම් **තුනක්** ලියන්න. (ලකුණු 06)

05. (i) ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට මංගලම් කීම පදනම් කරගෙන නිර්මාණය වූ යාච්ඤාව කුමක්ද? (ලකුණු 02)
    (ii) දේව මාතාවන් දර්ශනය වූ ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
    (iii) ඔබට ලැබී ඇති හැකියා දක්ෂතාවලට ස්තුති කරමින් යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ලකුණු 06)

06. (i) 'යාච්ඤාව' යනු කුමක්ද? (ලකුණු 02)
    (ii) පොදු යැදුම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
    (iii) ඔබ දිනපතා යාච්ඤා කරන අවස්ථා **තුනක්** ලියන්න. (ලකුණු 06)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 6X2=12)
    (එක් මාතෘකාවක් සඳහා වාක්‍ය **හයක්**වත් ලිවිය යුතුය.)
    (i) ස්වාමිවාක් ආරාධනාව
    (ii) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා
    (iii) රෝගීන්ගේ ආලේපනය
    (iv) දේව මැවිල්ල

***

**අවසාන වාර පරීක්ෂණය - 2022**
**කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය**
**06 ශ්‍රේණිය**

## I කොටස

01. (2) උත්පත්ති පොත
02. (3) ටෝරා ලෙස ය.
03. (1) සමගි සන්ධානය යි.
04. (1) මහ බ්‍රහස්පතින්දා ය.
05. (2) ගාබ්‍රියෙල් දේව දූතයා ය.
06. ✕
07. ✓
08. ✓
09. ✕
10. ✓
11. දිව්‍ය පූජා යාගයේ දී ය.
12. රාත්‍රි ආරාධනාව කිව යුතුය.
13. ගවයා ය.
14. හතරවන දේව පනත ය.
15. එළිසබෙත් තුමිය
16. යෙසායා
17. නික්මයාම
18. / දෙවන
19. මහා බ්‍රහස්පතින්දා
20. අභිවෘද්ධි ආලේපය (ලකුණු 2X20=40)

## II කොටස

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) උත්පත්ති (ලකුණු 02)
    (ii) දේව ස්වරූපය හා සමානකම/ ජීවන හුස්ම හෙලීම/ මිනිසා මැවූ දිනය ඉතා මනහර බව (ලකුණු 04)
    (iii) ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

02. (i) ටෝරා/ව්‍යස්ථාව/නීතිය/ මෝසෙස්ගේ නීති පොත (ලකුණු 02)
    (ii) උත්පත්ති/ නික්මයාම/ ලෙවී ව්‍යවස්ථාව/ ගණන් කතාව/ ලෙවී ව්‍යවස්ථාව/ ද්විතීය නීති සංග්‍රහය (ලකුණු 04)
    (iii) පාසලේ උදේ යාච්ඤාව/ දිව්‍ය පූජාවේ කියවීම/ යාච්ඤා මෙහෙයන් ආදිය (ලකුණු 06)

03. (i) පළමු පනත (ලකුණු 02)
    (ii) ජනවාරි 01 - පරිශුද්ධ දේවමාතා මංගල්‍යය/ අගෝස්තු 15 - දෙව් මව් සුරලොවට වැඩීමේ මංගල්‍යය (පෙළ පොත 70 පිටුව) (ලකුණු 04)
    (iii) දිව්‍ය පූජාවට සහභාගි වීම/ දහම් පාසලට සහභාගි වීම/ රෝගීන් බලන්නට යාම/ ශ්‍රමදාන කටයුතු සිදු කිරීම (ලකුණු 06)

04. (i) නමෝ මරිය යාච්ඤාව (ලකුණු 02)
    (ii) විශ්වාස ලක්ෂණය/ දයාධික මනස්ථාපය/ස්වාමිවාක් ආරාධනාව ආදී පිළිතුරු (ලකුණු 04)
    (iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

05. (i) මහ සිකුරාදා/ අළුබදාදා (ලකුණු 02)

(ii) පාපවලට වන්දි ගෙවීම/ ආත්ම දමනය/ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීම (ලකුණු 04)

(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

06. (i) දෙවියන් වහන්සේට වන්දනා ස්තුති ප්‍රශංසා කරන්නටත් අපට අවශ්‍ය දේ ඉල්ලා ගන්නටත් ඔවුන් වහන්සේ වෙත සිත යොමු කිරීම (ලකුණු 02)

(ii) පරිසිවරයා හා අයකැමියා/ වැන්දඹුව හා විනිශ්චයකාරයා/ (ලකුණු 04)

(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07. (i) 01 පාඩම

(ii) 13 පාඩම

(iii) 09 පාඩම

(iv) 21 පාඩම (ලකුණු 6X2=12)

***


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න